# ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

# ලංසු සඳහා ආරාධනයයි

**ලංසු නාමය - මාතර නගර සීමාව තුළ කාර්යාල ගොඩනැඟිල්ලක් වසර 10 ක් සඳහා කුලියට හෝ බද්දට ගැනීම -2026.**

**ලංසු අංකය - NGJA/18/60/2026**

1. ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියෙහි ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් මාතර ප්‍රාදේශීය කාර්යාලය ලෙස භාවිතා කිරීමට සුදුසු මාතර නගර සීමාව ඇතුළත ප්‍රධාන පාරකට මුහුණලා හෝ ආසන්නව, වාහන 3 ක් පමණ ගාල්කර තැබිය හැකි ජලය, විදුලිය, වායු සමීකරණ පහසුකම් හා ජලාපවහන පහසුකම් සහිත වර්ග අඩි 1800 - වර්ග අඩි 2500 ක පමණ ගොඩනැඟිල්ලක් කුලියට හෝ බද්දට ගැනීම සඳහා මුද්‍රා තැබූ මිල ගණන් කැඳවනු ලැබේ.

2. විෂය පථය පිළිබඳ සවිස්තරාත්මකව ලංසු ලේඛනයේ දක්වා ඇත.

| විස්තරය | ලංසු ඇපකරය (රු.) |
|---|---|
| ආපසු ගෙවනු නොලබන ලේඛණ ගාස්තුව | රු.3,500.00 + 2.5% SSCL (87.50) + 18% VAT(645.75) = (රු.4,233.25) |
| බැංකු ඇපකරයේ වටිනාකම | රු.120,000/- (වලංගු කාලය 2026.08.25 - 2026.12.22) |
| ලංසු පත්‍රිකා ලබා ගැනීම | 2026.08.12 දින සිට 2026.08.24 දක්වා |
| ලංසු පත්‍රිකා විවෘත කිරීම(දිනය/ වේලාව /ස්ථානය) | 2026.08.25 දින පෙ.ව. 11.00<br>ජා.මැ.ස්ව.අධිකාරිය. - 3 වෙනි මහල සැපයුම් අංශය |

3. ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ (NCB) ක්‍රියාපටිපාටිය භාවිතා කරනු ලබන අතර ලංසු ලේඛනයේ දක්වා ඇති සුදුසුකම් සහ අවශ්‍යතා සපුරාලන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (GOSL) ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල අර්ථ දක්වා ඇති පරිදි ලංසුකරුවන්ට විවෘත වේ.

4. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට 2026.08.12 සිට 2026.08.24 දින දක්වා ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය, නාරාහේන්පිට, ලේක් ඩ්‍රයිව් මාවත, අංක 260, RTFC & WMC ගොඩනැඟිල්ල, 3 වෙනි මහලෙහි සැපයුම් අංශයෙන් කාර්යාල වේලාවන් තුළ වැඩ කරන දිනයන්හි ලංසු පත්‍රිකා පරික්ෂාකර වැඩිදුර තොරතුරු ලබා ගත හැක. Tel: 2332197, Email: supply@ngja.gov.lk

5. ලිඛිත ඉල්ලීමක් මඟින් ආපසු ගෙවනු නොලබන රු.3,500.00 + 2.5% SSCL + 18% VAT ක මුදලක් (මුළු මුදල = රු.4,233.25), මුදලින් ගෙවීමෙන් පසුව සිංහල බසින් යුත් ලංසු පත්‍රිකා 2026.08.12 සිට 2026.08.24 දින දක්වා සතියේ වැඩ කරන දිනයන්වලදී පෙ.ව. 9.30 සිට ප.ව 3.00 දක්වා කාලය තුළ ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය, නාරාහේන්පිට, ලේක් ඩ්‍රයිව් මාවත, අංක 260, RTFC & WMC ගොඩනැඟිල්ලෙහි 3 වෙනි මහලෙහි පිහිටි සැපයුම් අංශයෙන් ලබා ගත හැක.

6. පූර්ව ලංසු රැස්වීම 2026.08.19 වන දින පෙ.ව.10.00 ට නාරාහේන්පිට, ලේක් ඩ්‍රයිව් මාවත, අංක 260, RTFC & WMC ගොඩනැඟිල්ලෙහි 4 වෙනි මහලෙහි පිහිටි ශ්‍රවණාගාරයේදී පැවැත්වේ.

7. මුද්‍රා තබන ලද මිල ගණන් පත්‍රිකා 2026.08.25 වන දින පෙ.ව. 11.00 ට හෝ එයට ප්‍රථම සභාපති,දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය, අංක 260, RTFC & WMC ගොඩනැඟිල්ල, ලේක් ඩ්‍රයිව් මාවත, නාරාහේන්පිට, යන ලිපිනයට ලැබීමට සැලැස්වීම හෝ 3 වෙනි මහලෙහි පිහිටි සැපයුම් අංශයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුයි. අයදුම්පත් බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවර "කාර්යාල ගොඩනැඟිල්ලක් කුලියට/ බද්දට මිලදී ගැනීම (මාතර) - 2026'' යනුවෙන් සඳහන් කළ යුතුය.

8. ඉහත සඳහන් පරිදි වාණිජ බැංකුවකින් ලබා ගත් රු.120,000/- වටිනාකමින් යුක්ත බැංකු ඇපකරයක් / ලංසු සුරක්ෂිතයක් ලෙස දින 119 කාලයක් වලංගු වන පරිදි (2026.08.25 දින සිට 2026.12.22 දින දක්වා) හෝ මුදලින් අධිකාරිය වෙත ගෙවීම් කර රිසිට්පත ඉදිරිපත් කළ යුතුය.

9. ලංසු ඉදිරිපත් කිරීමට නියමිත දින සිට දින 91 ක කාලයක් සඳහා ලංසු වලංගු විය යුතුය. (2026.08.25 සිට 2026.11.24)

10. ලංසු ඉදිරිපත් කිරීම සඳහා නියමිත කාලසීමාව අවසන් වූ වහාම, ඉහත 5 ඡේදය සඳහන් ලිපිනයට පෞද්ගලිකව සහභාගී වීමට තෝරා ගන්නා ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

11. ලංසු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ලංසුකරුවන් විසින් දරනු ලබන කිසියම් වියදමක් සඳහා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වගකියනු නොලැබේ.

වැඩි විස්තර දැන ගැනීම සඳහා - සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) - 0112332197

**සභාපති - දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව**

**ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය**

අංක 260, RTFC & WMC ගොඩනැඟිල්ල, ලේක් ඩ්‍රයිව් මාවත, නාරාහේන්පිට.

දුරකථන : 0112-329295, 2325364, 2390645-8 ෆැක්ස් : 0112320758, 011-2332197

වෙබ් අඩවිය : www.ngja.gov.lk